පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக்கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය ප්‍රථම (පැරණි නිර්දේශය) (බාහිර) - 2018 දෙසැම්බර්
முதற்கலைத்தேர்வு (வெளிவாரி) – December 2018
GENERAL DEGREE EXAMINATION IN ARTS (External) (Old Syllabus) - December 2018

# සමාජ විද්‍යාව I / Sociology I (SSG I)
## සමාජ විද්‍යාවේ න්‍යාය හා ක්‍රමවේද

එක් කොටසකින් ප්‍රශ්න 02ක් තෝරා ගෙන ප්‍රශ්න 04කට **පමණක්** පිළිතුරු සපයන්න.
මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි.
කාලය: පැය **තුනයි.**
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

---

### පළමු කොටස

1. සමාජ විද්‍යාව යනු කුමක්ද? සමාජ විද්‍යාව ස්වාධීන විෂයයක් ලෙස වර්ධනය වීමට යුරෝපයේ සිදුවූ කාර්මික විප්ලවයේ බලපෑම පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 25)

2. "මැක්ස් වෙබර් ගෙන් සමාජවිද්‍යාවට සිදුවූ දායකත්වය" යන මැයෙන් රචනයක් ලියන්න. (ලකුණු 25)

3. කෘත්‍ය වාදයේ ප්‍රධාන න්‍යායාත්මක දෘෂ්ටිකෝණ කවරේ ද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 25)

4. සංකේතාත්මක අන්තර් ක්‍රියාවාදය පිළිබඳ සී. එච්. කූලි සහ ජී. එච්. මීඩ් ඉදිරිපත් කළ අදහස් පැහැදිලි කරන්න. (ලකුණු 25)

### දෙවන කොටස

5. ගුණාත්මක පර්යේෂණ වල වාසි අවාසි සාකච්ඡා කරන්න. (ලකුණු 25)

6. ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය ගැටළුව අවම කිරීමට සුදුසු පර්යේෂණ සැලැස්මක් සකස් කරන්න. (ලකුණු 25)

7. සමාජවිද්‍යාත්මක පර්යේෂණ වල දී වඩා අවධානය යොමු කළ යුතු කරුණු මොනවා ද? (ලකුණු 25)

8. පහත සඳහන් මාතෘකාවලින් 03 තෝරාගෙන ඒවා පිළිබඳව කෙටි සටහන් ලියන්න. (ලකුණු 25)
   i. ප්‍රශ්න මාලා ක්‍රමය
   ii. සහභාගී නිරීක්ෂණය
   iii. සම්මුඛ සාකච්ඡා
   iv. ප්‍රත්‍යක්ෂ අධ්‍යයන

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக்கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය ප්‍රථම (පැරණි නිර්දේශය) (බාහිර) - 2018 දෙසැම්බර්
முதற்கலைத்தேர்வு (வெளிவாரி) – December 2018
GENERAL DEGREE EXAMINATION IN ARTS (External) (Old Syllabus) - December 2018

## සමාජ විද්‍යාව II / Sociology II (SSG : II)
### ව්‍යවහාරික සමාජ විද්‍යාව

ප්‍රශ්න 04කට පමණක් පිළිතුරු සපයන්න.
මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි.
කාලය: පැය තුනයි.
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

---

1. ව්‍යවහාරික සමාජ විද්‍යාව යනු කුමක් දැ යි පැහැදිලි කොට ව්‍යවහාරික සමාජ විද්‍යාඥයාගේ කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 25)

2. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන අධ්‍යාපන සේවාව පිළිබඳව විවේචනාත්මක රචනයක් ලියන්න. (ලකුණු 25)

3. ග්‍රාමීය සංවර්ධනයේ දී ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ කාර්යභාරය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 25)

4. ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් මුහුණ දෙන ගැටලු පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 25)

5. ශ්‍රී ලංකාවේ සිදු වන මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග ගැන සාකච්ඡා කරන්න. (ලකුණු 25)

6. දැදුරු ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 25)

7. ශ්‍රී ලංකාවේ ස්වාභාවික ආපදා කළමණාකරණ කටයුතු පාලනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ගැන විස්තර කරන්න. (ලකුණු 25)

8. පහත සඳහන් ඕනෑ ම මාතෘකා තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න. (ලකුණු 25)
   i. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය උවදුර
   ii. ශ්‍රී ලංකාවේ නාගරික දුගී බව
   iii. ශ්‍රී ලංකාවේ විවාහ කල් පමාව
   iv. ශ්‍රී ලංකාවේ විවාහක කාන්තාවන් රැකියා සඳහා විදේශ ගතවීම නිසා පවුල් මුහුණ දෙන ගැටළු

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக்கல்வி நிலையம
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය ප්‍රථම (පැරණි නිර්දේශය) (බාහිර) - 2018 දෙසැම්බර්
முதற்கலைத்தேர்வு (வெளிவாரி) – December 2018
GENERAL DEGREE EXAMINATION IN ARTS (External) (Old Syllabus) - December 2018

## සමාජ විද්‍යාව III/Sociology III (SSG: III)
### දකුණු ආසියාව පිළිබඳ සමාජ විද්‍යාව

ප්‍රශ්න **04කට පමණක්** පිළිතුරු සපයන්න.
මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි.
කාලය: පැය **තුනයි**.
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

---

1. දකුණු ආසියාව පිළිබඳ අධ්‍යයනයේදී ගැමි සමාජ ආකෘතියේ ඇති අදාලතත්වය විවේචනාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 25)

2. දකුණු ආසියාව සංස්කෘතික කළාපයක් වන්නේ කුමන අරුතකින් ද? (ලකුණු 25)

3. ශ්‍රී ලංකාවේ ගැමි කෘෂිකර්මාන්තය යාන්ත්‍රිකරණය වීමේ සමාජයීය ප්‍රති විපාක කවරේ ද? (ලකුණු 25)

4. ඥාතීත්වය දකුණු ආසියානු සමාජවල දේශපාලනයේදී සැළකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. සාකච්ඡා කරන්න. (ලකුණු 25)

5. අකුණු ආසියානු සමාජයේ මූලික වශයෙන් සමාන වර්ගයේ සමාජ ගැටළු දක්නට ලැබේ. සාකච්ඡා කරන්න. (ලකුණු 25)

6. ශ්‍රී ලංකාවේ බුදු දහම පිළිබඳව සළකන විට ජනප්‍රිය ආගමික සැදැහැවත්භාවය සහ ධර්මයේ ස්වභාවය අතර ඇති සම්බන්ධතාවය විවේචනාත්මකව විස්තර කරන්න. (ලකුණු 25)

7. අසංවිධිත නාගරිකරණය දකුණු ආසියාවේ නගරවල විශාල පාරිසරික ගැටළු ඇති වීම සඳහා බලපා ඇත. මෙම කියමන සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 25)

8. පහත දැක්වෙන මාතෘකා වලින් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න. (ලකුණු 25)

    1. මහා සම්ප්‍රදායයය සහ චූල සම්ප්‍රදාය
    2. ලංකාවේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය
    3. දකුණු ආසියාවේ සමාජ ව්‍යාපාර
    4. ගෘහස්ථ ප්‍රචණ්ඩතත්වය
    5. අකුණු ආසියාවේ කාන්තාව